2021.07.28

**චක්‍රලේඛ අංක 01/2021**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය ආයතන හා අනෙකුත් ආයතනයන්හී ප්‍රධාන විධායක නිලධාරීන්,
සියලුම රාජ්‍ය ආයතනයන්හී සභාපතිවරුන්,
ශ්‍රී ලංකාව තුළ ඉංජිනේරු වෘත්තිකයින් සේවයෙහි යොදවා ගනුලබන සියලුම රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පුද්ගලික ආයතන ප්‍රධානීන්,
සියලුම ප්‍රධාන මූල්‍ය නිලධාරීන් හා
සියලුම ඉංජිනේරු වෘත්තිකයන් වෙත.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන නීත්‍යානුකූල ලියාපදිංචිය.**

1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව මගින් නිල වශයෙන් ලියාපදිංචි වී තිබිය යුතු බවට 2017 අංක 4 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනත මගින් නෛතිකව නියම කර ඇත.

2) ඉහත කී පනතේ නීති ප්‍රතිපාදන අනුව, යම් තැනැත්තෙකු හෝ කිසියම් තැනැත්තෙකු හට ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස නම සඳහන් කිරීමට හෝ ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස පෙනීසිටීමට හෝ ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස නිල තත්ත්වයෙන් ක්‍රියා කිරීමට හෝ සේවයේ යෙදීමට ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වී තිබීම අනිවාර්ය වන අතර එසේ ලියාපදිංචි නොවූ කිසිදු තැනැත්තෙකු හට ශ්‍රී ලංකාව තුළ පුද්ගලිකව හෝ, රාජ්‍ය අංශයේ හෝ, පුද්ගලික අංශයේ හෝ ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස තනතුරු දැරීමට හෝ පෙනීසිට ක්‍රියා කිරීමට නීතිමය බලයක් නොමැති බව නීතිගත කර ඇත.

3) එසේ හෙයින් කිසියම් තැනැත්තෙකු ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස තමාවම හඳුන්වාගනු ලබන්නේ නම් හෝ, රජයේ මුදල් හෝ අරමුදල් වලින් ඉංජිනේරු වෘත්තිකයෙකු හැටියට වැටුප් හා/හෝ දීමනා ලබන්නේ නම්, හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නේ නම්, ඊට ප්‍රථමව ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ "අ" උප ලේඛනයේ පරිදි අදාල සුදුසුකම් වලට අනුකූලව ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි වී නොසිටීම හා අදාල ඉංජිනේරු වෘත්තීය කාණ්ඩයේ ලියාපදිංචි නාම ලේඛනයට නම ඇතුලත් කර නොතිබීම එකී පනත යටතේ තහනම් හා නීති විරෝධී වේ.

4) ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ 17 වන වගන්තිය යටතේ යම් ඉංජිනේරු වෘත්තිකයෙකු සිය ලුහුඬු පදවි නාම භාවිතා කරන්නේ නම් අදාල කාණ්ඩය යටතේ අදාල ලුහුඬු නාමය භාවිතා කිරීමට අයිතිය ලබා සිටිය යුතුය.

5) ඉහත 4 වන ඡේදයේ සඳහන් ඉංජිනේරු වෘත්තිකයෙකු හැටියට ලුහුඩු පදවි නාමයක් භාවිතා කිරීමට පනතේ 15 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ අදාල කාණ්ඩය යටතේ ලියාපදිංචිවී සිටිය යුතුය.

6) 2017 අංක 4 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ "අ" උප ලේඛනයේ දැක්වෙන ඉංජිනේරු වෘත්තිකයන්ගේ සුදුසුකම් ලැයිස්තුව අනුව ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය හා පුද්ගලික අංශයේ රැකියාවන් වලට ඇතුලත් වීම සඳහා අවශ්‍ය කරන අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය අවශ්‍යතා සියල්ල සපුරා ඇත්දැයි විමසීමෙන් පසු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් සෑහීමකට පත්වන අයවලුන් ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තීය කටයුතු වල යෙදීමට ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් දෙනු ලබන අවසරය ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වී සිටීම බවට අවසානාත්මක සුදුසුකම වන අතර මෙකී සුදුසුකම් පරීක්ෂාව අවිච්ින්න සංස්ථා පැවැත්මක් සහිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් දෙනු ලබන නිල හා නීත්‍යානුකූල අවසරය වේ.

7) ඉහත කී සුදුසුකම් පරීක්ෂාව හා ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි කර අවසර දීම පිළිබඳ පරීක්ෂාව ඉහත කී පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව පහත ආකාරයට සංස්ථාපනය වූ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් ඒකමතිකව නිශ්චය කොට ප්‍රකාශ කරන නිල වෘත්තීය අවසරය වේ. ඒ අනුව මෙකී ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව,

**<u>ඍජු නිල පත්වීම්</u>**

3 (අ) (i) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන මහාචාර්යවරයෙකුගේ මට්ටමට අඩු නොවන ඉංජිනේරු පීඨවල පීඨාධිපතිවරු තිදෙනෙකු හෝ ඔවුන්ගේ නාමිකයින් තිදෙනෙකු මගින් ද,

තෘතියික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ද,

**<u>පත්කළ සාමාජිකයින්</u>**

3 (ආ) (i) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටවූ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නම්කළ වරලත් ඉංජිනේරුවරුන් 7 දෙනෙකු විසින් ද,

3 (ආ) (ii) ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවන්ගේ ආයතනය විසින් නම් කළ විවිධ ඉංජිනේරු විෂයන් නියෝජනය කරන සාමාජිකයින් 4 දෙනෙකු විසින් ද,

3 (ආ) (iii) රාජ්‍ය අංශයේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය මගින් නම් කළ වරලත් ඉංජිනේරුවරයෙකු විසින් ද,

3 (ආ) (iv) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටවූ තෘතියික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නම් කල ඉංජිනේරු කාර්මිකයන්ගේ නියෝජිතයෙකු විසින් ද,

යන නිල පත්වීම් සහිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස තෝරා ලියාපදිංචි කර ලැයිස්තුගත කරනු ලබන්නේය.

8) මෙම නෛතික තත්ත්වය, වෙනසක් නැතුව ශ්‍රී ලංකාව තුල රාජ්‍ය හා පුද්ගලික අංශයේ මෙන්ම ස්වයං රැකියා වල යෙදෙමින් හා ආයතනගතව සේවය කරමින් සිටින ඉංජිනේරු වෘත්තිකයන් ලෙස නම නියෝජනය කරන සියල්ලන්ට ද අදාළ වේ.

9) එසේම, යම් විදේශීය ඉංජිනේරු වෘත්තිකයෙකු යම් ව්‍යාපෘතියක් හේතුවෙන් හෝ කාර්යයක් හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ඉංජිනේරු වෘත්තිකයෙකු හැටියට තාවකාලිකව ක්‍රියා කරන්නේ වුවද, හා/හෝ තාවකාලිකව නිශ්චිත කෙටි කාලසීමාවකට ශ්‍රී ලංකාව තුල සේවයේ යොදවාගන්නේ වුවද, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ අවසරය ලබාගත යුතුය. ඒ සඳහා එකී සභාව විසින් පරීක්ෂා කර බලා පනවනු ලබන කොන්දේසි වලට යටත්ව මාස 4 ක් නොඉක්මවන කාලයක් සඳහා තත්කාර්යය වෙනුවෙන් තාවකාලික ලියාපදිංචියක් ලබාගෙන මිසක ඉංජිනේරු වෘත්තීය කටයුතු නොකළ යුතුය.

10) ඉහත ලියාපදිංචි කටයුතු වලට අදාළව ශ්‍රී ලංකා ජනරජයේ අංක 2198/9 සහ 2020.10.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මේ සඳහා රෙගුලාසි ප්‍රසිද්ධ කර තිබේ.

11) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතනික ව්‍යුහයට වූ බලපෑම සැලකිල්ලට ගෙන ඉහත කී ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ලියාපදිංචි වීම සඳහා වන සහන කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කල බව ප්‍රකාශ කරනු ලැබේ.

12) ඒ අනුව යම් අයෙක් ඉහත කී ලියාපදිංචිය නොලබා ශ්‍රී ලංකාව තුළ ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස පෙනීසිටීම හා ක්‍රියාකිරීම නීතියට එරෙහි බවත්, එවැන්නෙකු නිසි ලියාපදිංචිය නොමැතිව සේවයේ යොදවා ගැනීම එකී වරද හා බැඳුණු ආනුශාංගික වරදවල් අතරේ වන, වරදට අනුබල දීම යන වරද හා/හෝ ඒ හා බැඳුණු වරදවල් වලට ඇතුලත් විය හැකි බවත්, සඳහන් කරනු ලැබේ.

13) එබැවින් ඉහත කී ගැසට් පත්‍රයේ සඳහන් ඉංජිනේරු වෘත්තිකයින්ගේ කාණ්ඩයන් අතරින් එක් එක් ඉංජිනේරු වෘත්තිකයා අයත් කාණ්ඩයට සාරානුකූලව ලියාපදිංචි විය යුතු බව ප්‍රකාශ කරනු ලැබේ. ඒ උදෙසා තමා අයත් වෘත්තීය මණ්ඩල හරහා ඉහත කී ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ කියවෙන රෙගුලාසි ප්‍රකාරව ඉල්ලුම් කර, සුදුසුකම් ඉදිරිපත් කර ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවෙන් ලියාපදිංචිය අනුමත කරවාගෙන අවසර ලබාගත යුතුය.

14) රාජ්‍ය මූල්‍යට අදාළ වන තාක් දුරට ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස තැනැත්තන් සේවයෙහි යොදවා ගැනීම සඳහා වන බඳවාගැනීමේ පටිපාටි වලදී හා උසස්වීම් වලදී අදාළ කරගනු පිණිස මෙම චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරුන් වෙතද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවන්හී ලේකම්වරුන් වෙතද, සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙතද, යොමුකරනු ලැබේ.

මෙම චක්‍රලේඛය 2021.07.26 දින සිට ක්‍රියාත්මක බව ප්‍රකාශ කරනු ලැබේ.

තිලක් ද සිල්වා

ඉං.ජි. තිලක් ද සිල්වා
සභාපති
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

පිටපත්:-

1. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
2. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
3. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.
4. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස.